**දකුණු ආසියා උප කලාපීය ආර්ථික සහයෝගිතාවයෙන් කුළුණු මතින් දිවෙන වරාය ප්‍රවේශ ව්‍යාපෘතිය යටතේ වැඩපල ගොඩනැලි සංකීර්ණ ඉදිකිරීම් ව්‍යාපෘතිය - 2023**

------------------------------------------------------------------------------------------------------------------------

දකුණු ආසියා උප කලාපීය ආර්ථික සහයෝගිතාවයෙන් කුළුණු මතින් දිවෙන වරාය ප්‍රවේශ ව්‍යාපෘතිය යටතේ වැඩපල ගොඩනැලි සංකීර්ණ ඉදිකිරීම් ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2019 ජනවාරි 17 දින එළඹි අංක 3716-එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම සහ ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව,වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා වරාය අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

කුළුණු මතින් දිවෙන වරාය ප්‍රවේශ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දැනට පවතින වැඩපල ගොඩනැගිල්ල වෙනත් ස්ථානයකට ගෙන යාමට අවශ්‍ය වීම සහ ණය ගිවිසුමේ ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, ජාතික වරාය ප්‍රධාන සැලැස්මට අනුව වරාය පහසුකම් සංවර්ධනය සඳහා සූදානම් වීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට සහාය වීම ව්‍යාපෘතියේ අරමුණ වේ.

ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,090.08 කට සමාන එ.ජ.ඩො. මිලියන 6.11ක් වන අතර ඉන් රු. මිලියන 1,090.08 කට සමාන එ.ජ.ඩො. මිලියන 6.11 සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි.

ව්‍යාපෘතිය එහි කටයුතු 2021 සැප්තැම්බර් 09 දින ආරම්භ කර ඇති අතර 2022 ජූනි 09 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර කරන දිනය 2023 ජූනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදීෙ

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු / විගණන නිරීක්ෂණය | මුදල රු. මිලියන | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| නියමිත කාලසීමාව තුළ ව්‍යාපෘතියේ අරමුදල් යෙදවීමට අපොහොසත් වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ලබා නොගත් ණය ලද මුදල් මත රු.මිලියන 65ක බැඳීම් ගාස්තු ණය නියෝජිතායතනය වෙත ගෙවා ඇති අතර 2023 දෙසැම්බර් 31 දිනට සමුච්චිත බැඳීම් ගාස්තු රු. මිලියන 83 විය. | රු.මිලියන 65 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය (SLPA) සහ මාර්ග සංවර්ධන අධිකාරිය (RDA) යන දෙකටම මෙම ණය පහසුකම ලබා දී ඇත. RDA විසින් 2019 වර්ෂයේදී ණය ලබා දීම ආරම්භ කර ඇති අතර එමගින් ණය මුදලෙහි ඉතිරි සම්පූර්ණ මුදල සඳහා බැඳීම් ගාස්තු සක්‍රීය කර ඇත. ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) ව්‍යාපෘති පරිපාලන අත්පොත (PAM) අනුව, සම්පූර්ණ ණය සඳහා සම්පූර්ණ බැඳීම් ගාස්තු (SLPA+RDA කොටස්) USD මිලියන 0.8 ක් වන අතර සම්පූර්ණ ණය සඳහා මුළු පොලී ගාස්තු (SLPA + RDA potions) USD මිලියන 15.4 වේ. මෙය දැනටමත් ඇමරිකානු ඩොලර් මිලියන 300 ක මුළු ණය මුදලට ඇතුළත් කර ඇත. | ව්‍යාපෘතියේ පිරිවැය අඩු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |